**IPRC/16/325**

# හගුරන්කෙත පොත්ගුල් මාළිගා රජමහා විහාරයේ පුස්කොළ පොත් එකතු පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක් (නුවරඑළිය දිස්ත්‍රික්කය ඇසුරෙන්)

ලැගුම්දෙනියේ පියරතන හිමි[1*]

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක අධ්‍යයනයක යෙදීමයි. පුස්කොළ පොත් බහුල වශයෙන් පවතින ප්‍රධාන රජමහා විහාරවල පුස්කොළ එකතු අධ්‍යයනයට යොදා ගන්නා ලදී. ඒ අනුව හගුරන්කෙත පොත්ගුල් මාළිගා රජමහා විහාරයේ නියැදිය වශයෙන් තෝරා ගැනිණි. ඊට හේතුව විහාරය සතු පුස්කොළ පොත් එකතුව ග්‍රන්ථ විද්‍යාත්මක තත්වයන් පිළිබඳ සාධාරණීයකරනය කළ හැකි යැයි අපේක්ෂා කෙරිණි. මෙම අධ්‍යයනයට ලක් කල පුස්කොළ පොත් එකතුව තුළ විවිධ විෂයන් ආවරණය නොවුණ ද ත්‍රිපිටක කෘතීන්, සියම් කෘතීන්, පද්‍ය කෘති මෙන් ම සාහිත්‍ය කෘතීන් පිළිවෙල දැකිය හැකි විය. වැඩි වශයෙන් ත්‍රිපිටක යන කෘතීන් දැකිය හැකි විය.

මෙම පොත් එකතුවේ කෘතීන් 246 ක් දැකිය හැකි විය. එම ග්‍රන්ථ 246 ම අධ්‍යයනයට ලක් විය. මෙම අධ්‍යයනයට ලක් කරවූ කෘතීන්වල විෂය ක්ෂේත්‍රය හඳුනා ගැනීමට අතිරේකව ඒවායේ ග්‍රන්ථ විද්‍යාත්මක ලක්ෂණයන් කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු කිරීමට මෙම අධ්‍යයනයේ දී හැකිවිය. මෙම අධ්‍යයනයේ දී පුස්කොළ පොත් පිළිබඳ වාර්තා ගත කිරීමේ දී භාවිත කළ යුතු ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර, වර්ගීකෘත, අකාරාදී ආදී අනුක්‍රමවලින් පෙළ ගැස්වීමේ අවශ්‍යතාවයක් පවතී. ඒ අනුව මේ සඳහා ලේඛන රැගත් ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය සිදුකොට ඇත. පෙළ ගැස්වීමේ විධි ක්‍රමය යන කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර, එකී විහාරස්ථානය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් සම්පාදනය කරනු ලැබේ.

***ප්‍රමුඛ පදඃ*** *පුස්කොළ පොත් ,ලේඛන කලාව, පොත්ගුල් රජමහා විහාරය, ග්‍රන්ථ නාමාවලි, දේශීය ඥාණය.*

[1] කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. *piyarathana1010@gmail.com